# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2244/6 – 2021 සැප්තැම්බර් 06 වැනි සඳුදා – 2021.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2017 ජනවාරි මස 26 වැනි දින අංක 2003/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2017 අංක 26 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/6/2016/HW/243.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: DEV/LND/02/ACQUI/05-06.
2021 අගෝස්තු මස 10 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, පල්ලේ අපරැක්ක, උඩ අපරැක්ක, හිගුරුපත්තල ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MA/DVN/2020/176 හා 2020.11.17 දිනැති අනුරේඛනයේ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස:

01. කැබලි අක්ෂර 'ඒ' – දියහැලිලන්දෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0004 ක් පමණ

උතුරට: මු.පි.මාර 2724 හි කැබලි අංක 107 සහ ජී. එම්. අතපත්තු හිමිකම් කියන දියහැලිලන්දෙවත්ත; නැගෙනහිරට: ජී. එම්. අතපත්තු හිමිකම් කියන දියහැලිලන්දෙවත්ත සහ මු.පි.මාර 2724 හි කැබලි අංක 107; දකුණට සහ බටහිරට: මු.පි.මාර 2724 හි කැබලි අංක 107.


1A – G 34550 – 20 (2021/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*